# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 22 දරන ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2000 ජුනි මස 28 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජුනි මස 30 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **5.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**2000 අංක 22 දරන ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2000 ජූනි මස 28 වන දින]

එල්. ඩී.–ඕ. 44/98.

**ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව.

"ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සමිතියත්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාරය සහ එයට අයත් අනුබද්ධ හා සම්බන්ධ සියලු විහාර, ආරාම, පන්සල්, සිද්ධස්ථාන සහ ආයතන සැලසුම් කිරීම, පවත්වා ගෙන යාම සහ සංවර්ධනය කිරීම යන අරමුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් බොරලැස්ගමුව, පැපිලියානේ ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාරයෙහි පිහිටුවා තිබූ හෙයින් ද :

ඒ සමිතිය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා අරමුණු සඳහා ද එම අරමුණු සහ පරමාර්ථ මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ ඒ සභාව සංස්ථාගත කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

1. මේ පනත 2000 අංක 22 දරන ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු 'සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) පැපිලියාන ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාවේ දැනට සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් "ශ්‍රී සුනේත්‍රා මහාදේවි පිරිවෙන් රාජමහා විහාර ශාසන සංවර්ධන සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු

මුද්‍රාවක් තබා ගැනීමටද, එය භාවිතා කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද, එකී සංස්ථාවේ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පැවරීම හා පවරනු ලැබීම කළ හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :-

(අ) බෞද්ධාගමේ සියලු අංශ අධ්‍යයනය කිරීමට සහ පර්යේෂණ කිරීමට අනුග්‍රහය දැක්වීම ;

(ආ) බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම ;

(ඇ) දහම් පාසල්, පිරිවෙන් සහ අභ්‍යාස මධ්‍යස්ථාන ඇතුළු අධ්‍යාපනික ආයතන පිහිටුවීම හා නඩත්තු කිරීම ;

(ඈ) බුද්ධ ධර්මය සහ බෞද්ධ සාරධර්ම ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචාරය කිරීම ;

(ඉ) බෞද්ධ උත්සව, චාරිත්‍ර, පූජා විධි, පිළිවෙත් හා පාරම්පරික සිරිත් ප්‍රවර්ධනය කිරීම හා සුරැකීම ;

(ඊ) ප්‍රජා සුභසාධනය, සංස්කෘතික හා සමාජ සංවර්ධන සේවා ප්‍රවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා නිරතවීම;

(උ) බුදුදහම ඉගෙනීම වැඩි දියුණු කිරීමේ අදහසින් ශිෂ්‍යත්ව, අධි ශිෂ්‍යත්ව, ත්‍යාග, සහතික හා වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීම ;

(ඌ) භික්ෂූන් වහන්සේලාට ධර්ම ප්‍රචාරක කටයුතු භාර ගැනීමට හැකිවන පරිදි ඔවුන් ගේ අධ්‍යාපනය සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය සියලුම භෞතික හා වෙනත් යටිතල පහසුකම් සැලසුම් කිරීම, සැපයීම හා සංවර්ධනය කිරීම ;

(ඒ) සාමය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජාව තුල ආගමික, වාර්ගික, ජනවාර්ගික සහ ජාතික සමගිය වැඩි දියුණු කිරීම ;

(ඔ) අනාථ, ආබාධිත, මහළු හා ගිලන් සහ අවතැන් වූ පුද්ගලයන්ගේ සුභ සාධනය, පුහුණුව සහ පුනරුත්ථාපනය සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඕ) පුස්තකාල, විඥාපන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ක) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය, හිතකර හා ආනුෂංගික වන වෙනත් කටයුතු හා කාර්යයන් ඉෂ්ට කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වසා දැමීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන, ත්‍යාග රික්ථවරණ, පරිත්‍යාග, සම්මාදම් හා ගාස්තු භාර ගැනීමේ හා එකතු කර ගැනීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනිම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කරගැනීමේ, සේවයේ යෙදවීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය හෝ නංවාලීම සඳහා හිතකර හෝ අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේ ඉටු කිරීමේ, සිදු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිලධරයන් සහ සංස්ථාවේ තත්කාලයේ රීති මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි හා ඒ අනුව තෝරා පත් කර ගත යුතු වන එවැනි වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් මගින් සංස්ථාවේ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් කලින් කල සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණි ඡන්දය දෙන්නා වූ සාමාජිකයන් බහුතරයකගේ ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සාමාජිකයන් බඳවා ගැනීම, ඉවත්වීම හෝ ඉවත් කිරීම, නිල දරන්නන් තෝරා පත් කර ගැනීම, නිල දරන්නන්ගේ මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම, සංස්ථාවේ සහ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය, පටිපාටිය සඳහා සහ වෙනත් ආකාරයෙන් සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ අරමුණු සපුරා ගැනීම සඳහා සෑදිය හැකි ය. එසේ සාදනු ලැබූ විට එම රීති එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම වෙනස් කිරීම, ඊට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සභාවේ රීති, ඒවා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එය සතු අරමුදලක් තිබිය යුතු අතර පරිත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් භාරගනු ලබන සියලුම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

(2) සංස්ථාවේ බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සභාව විසින් ගෙවිය යුතුව තිබූ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සභාවට අයවිය යුතුව තිබූ සියලුම ණය සහ ලැබිය යුතුව තිබූ ණය සහ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල දේපළක් දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**11.** සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලයේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් විසින් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක් හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.